දඬුවම විනය හා ළමයා

මානව ප්‍රජාවේ දිසානතිය හා සංවර්ධනය තීරණය කරන ප්‍රධානතම සාධකයක් වනුයේ ඒම ප්‍රජාව සිය ළමයින්ට කෙතරම් හොඳින් සලකනවාද යන්න මතයි. එහි දී ප්‍රචණ්ඩත්වය, දඬුවම, හා විනය යන කරුණු තුළ අප ප්‍රජාවද අතරමන් වී ඇති බවක් පෙනේ. මේ නිසාවෙන් බොහෝ දරුවන් පාසල් හැර ගොස් ඇත. නිවසින් පැන ගොස් ඇත. සමාජයට හා වැඩිහිටි ප්‍රජාවට වෛර කරනු ඇත. අපරාධකරුවන් හා මානසික රෝගීන් බවට පත් වී ඇත. සියදිවි නසාගැනීම හා පහර දී මරණයට පත් කිරීම්ද සිදුව ඇති බැවින් මේ පිළිබඳව සාකච්ජා කිරීම කාලෝචිත යැයි හැඟේ.

ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය යනු ලිංගික අපයෝජන ද ඇතුලත්ව සියලු ආකාරයේ මානසික, කායික ප්‍රචණ්ඩත්වය ,තුවාල කිරීම සහ අපයෝජන, නොසලකා හැරීම හෝ නිගරු ලෙස සැලකීම හෝ සූරා කෑම ලෙස හඳුන්වයි. (UN Report, pinheiro 2006,p.25)

ප්‍රචණ්ඩත්වය යන්න විශාල පරාසයක් ඔස්සේ දිවෙන නමුත් අද අප කථා කරනුයේ කායික ප්‍රචණ්ඩත්වයට අයත් කායික දඬුවම් සම්බන්ධවයි. ප්‍රචණ්ඩත්වය අපරාධයකි. කායික ප්‍රචණ්ඩත්වය ද අපරාධයකි. ඒසේ නම් ළමයින් තැනීම උදෙසා එවන් අපරාධයක් භාවිතයට ගැනීම කෙතරම් ප්‍රායෝගිකද යන්න විමසා බැලිය යුතුය.

දඬුවම, පහරදීම හා විනය දකුණු ආසියාව තුළ එකට එකාබද්ධව පැවත ඒයි. ඇතැම් උගතුන් හා වියතුන්ද ප්‍රකාශ කරනුයේ ගුරුවරයා තමාට පහර දී තැනූ

නිසා ඔවුන් ඒ තැනට පැමිණි බවයි. නමුත් ඔවුන්ට නොතේරෙන කරුණ නම් ඔහුට පහර නොදී තැනුවා නම් ඔහු ඊටත් වඩා ඉහළට යාමට හැකිව තිබූ බවයි.

කායික අපයෝජනයට අයත් කායික දණ්ඩනය දරුවන් රැකබලා ගන්නන් සතුව ඇති බලය විනය සමග පටලවා අයුතු ලෙස මුදාහැරීමකි. ළමයින්ට පහර දීම, සෙලවීම, හැපීම, කෙනිත්තීම, දණගැස්සීම, අව්වේ සිටවා තැබීම, පිලිස්සීම, තල්ලුකිරීම, ටොකු ඇණීම, අත්පා කන් ඇඹරීම වැනි කායික හිංසනයන් යෙදීමෙන් වින්දිත ළමයාගේ ශරීරයේ සීරීම්. තැලීම්, ඉරීම්, කැපීම්, ඇණීම්, පිලිස්සීම්, බග්න දකනට ලැබේ. ඒවා සිදු වනුයේ ඔබ සතු බලය චර්යා හැඩගැස්වීමේ මෙවලමක් කර ගැනීමෙනි. ඔබගේ කායික බලය, සමාජ බලය, සංස්කෘතික බලය, සිතීමේ බලය, ජීවවිද්‍යාත්මක වැනි බලයන් තුලින් බලසම්පන්න ප්‍රතාපවත් මිනිසෙකු ලෙස ළමයින් ඉදිරියේ වැජබීය හැකිය. එහෙත් එය ළමයා වැජබීමට කිසිදු හේතුවක් නොසපයයි. නමුත් යහපත් විනය ගරුක ළමයෙකු බිහි කළ හැක්කේ ළමා සංවර්ධනය දෙස අවධානය යොමු කළ ළමයා කේන්ද්‍රකරගත් ළමා හිතකාමී ගුරුවරුන් හා දෙමාපියන් සතු බලයන් උචිත පරිදි ළමයා ඉදිරියේ දියකර හැරීමෙන් පමණි.

සැබැවින්ම ඔබ ළමයින්ට කායික දඬුවම් පමුණුවනුයේ ඇයි. ඔබ කියාවි මම දරුවාට අසීමිත ලෙස ආදරය නිසා බව, ළමයාගේ යහපත උදෙසා බව, වැරදි නිවැරදි කිරීම උදෙසා බව, ළමයා හදාගැනීමට නිසා බව, යනුවෙන් දහසක් හේතු කියාවි. එහෙත් ඔබ ඇත්තටම ළමයාට පහර දෙනුයේ **ඔබගේ කේන්තිය, තරහ පාලනය කර ගැනීමට නොහැකි වීමේ ප්‍රතිඵලයක් ලෙසයි.** පහරදෙන්නා කිසි විටෙකත් සිනා සිසී දරුවාට පහර නොදේ. එසේම වරද සිදු වී පැය ගණනකට පසුව පහර දීමේ ප්‍රවනතාවයද ඉතා අඩුය. පසුව ඔබගේ කේන්තිය තරහ පාලනය වූ පසු ඔබ එය ළමයාට ඇති ආදරය සෙනෙහසට ලඝුකර අර්ථකථනය කරනු ඇත. දෙමාපියන් ගුරුවරුන් සැබවින්ම දරුවන්ට ආදරය කරයි. ඒහෙත් ඔවුන් දරුවන්ට පහර දෙති. ඒය එසේ වනුයේ ආදරය හා ප්‍රචණ්ඩත්වය එකට සම්බන්ධ කර ඇති බැවිනි. ඒ සඳහා අපගේ සංස්කෘතිය තුලින්ද පහර දීම සාධාරණීය කර ඇත.

ජාතික ළමා ආරක්ෂක අධිකාරියට සෑම වසරකම ලැබෙන පැමිණිලිවලින් 30% පමණ ළමයින් කෲරත්වයට පත් කිරීමට අදාල පැමිණිලි වේ. එම පැමිණිලිවල වගඋත්තරකරු ලෙස වැඩි වශයෙන් සඳහන් වනුයේ දෙමාපියන් හා

ගුරුවරුන්ය. එසේම ඒහි වැඩිපුරම වින්දිතභාවයට පත් වන ළමා කාණ්ඩය වනුයේ වයස අවුරුදු 11-15 දක්වා වන පිරිමි ළමයින්ය. අවුරුදු 11-15 යනු ළමයින්ගේ සුවිශේෂී වර්ධන අවධියකි. නව යොවුන් වියේ ළමුන් තුළ කායික වෙනස්වීම්, මානසික වෙනස්වීම්, ජීව විද්‍යාත්මක වෙනස් වීම්, සාමාජීය වෙනස් වීම් රැසක් ඒක විට සිදුවන කාලය මෙයයි. හෝර්මෝන වර්ධනය, ද්විතීක ලිංගික ලක්ෂණ පහළ වීම, ළමයා ක්‍රියාශීලී වීම, ළමයාගේ අත පය ඔහුගේ පාලනයෙන් ගිලිහීයාම වැනි සුවිශේසී වර්ධන ක්‍රියාවන් රැසක් නිසා ළමයා දැඩි ව්‍යාකූලතාවකට පත්වන කාලවකවානුවකි. බොහෝ දරුවන් දෙමාපියන් හා ගුරුවරුන්ගේ දඬුවමට ලක්වනුයේ මෙම සංවර්ධන අවධිවල වෙනස්කම් දරා ගැනීමට හා අවබෝධකර ගැනීමට නොහැකි වීමෙනි.

දකුණු ආසියාවේ වෙසෙන ළමයින්ගෙන් 88.6% ක් පවුල තුලින් කායික දණ්ඩනයට පත් වේ.

දකුණු ආසියාවේ පාසල් තුළ සිටින ළමුන්ගෙන් 97% ක් කායික දණ්ඩනයට ලක් වේ.

ශ්‍රී ලංකාවේ පාසල තුළ දී ළමුන් 80.4% ක් කායික දණ්ඩනයට ලක් වේ.

ශ්‍රී ලංකාවේ පාසල් තුළ ළමුන්ගෙන් 72.5% මානසික හිංසනයට ලක්ව ඇත.

නොසලකා හැරීම හා වෙනස් ආකාරයෙන් සැලකීම හේතුවෙන් දකුණු ආසියාවේ දැරියන් දසදෙනෙකුගෙන් ඒක් අයෙකු මිය යයි. (We can end All valence against Women p.6)

කායික දඬුවමක් ලෙස දරුවාට පහර දීම හෝ බලය දරුවා මත යෙදීම තුලින් ළමයා ඉගෙන ගනු ලබන පළමු පාඩම වනුයේ **"යමක් කරවා ගැනීමට අවශ්‍ය නම් ප්‍රචණ්ඩත්වය වැපිරවිය යුතුය යන්නයි."** ලංකාවේ බොහෝ පුද්ගලයින් දෙස බලන විට ඒම කියමන කෙතරම් සාධාරණද යන්න වටහා ගැනීමට පුළුවනි. ළමයින්ට පරද දීම හා ප්‍රචණ්ඩත්වය වැපිර වීම සංස්කෘතියකි. එබැවින් එවන් දූර්වලතාවයක් අප තුළ පවතිය යන්න පිළිගැනීමටවත් අප මනස සූදා නම් නැත.

පහර දී නිවැරදි කිරීමට කටයුතු කළ ළමයින්ගේ ස්වයං පාලනය අඩුය. ආක්‍රමනශීලීත්වය වැඩිය. ආත්ම අභිමානය දූර්වලය. සතුට නැත. කෝපය පාලනය කරගත නොහැක. අධ්‍යාපනයට අසමත්ය. මත් ද්‍රව්‍ය හා මත් පැන් භාවිතයට පෙළඹේ. අධි ක්‍රියාශීලීය. ඇතැමුන් ක්‍රියාශීලී නැත. ත්‍රාශ්‍යජනක ක්‍රියාවල නිරත වේ. සාපරාධි චර්යාවලට යොමු වේ. නිවසින් පැන යා හැක. අයාලේ යා හැක. කාංසාවෙන් යුතුය. වැඩිහිටියන් හා සමාජය ප්‍රත්ක්ෂේප කරයි. වයසට නොගැලපෙන චර්යා පෙන්වයි. ඒම චර්යා අක්‍රමතා මෙන්ම ඇති බරපතලම ගැටළුව නම් ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වත්මන් සහ අනාගත පරම්පරාවලට ගිණිය නොහැකි පිරිවැයක් දැරීමට සිදුවීමයි.

බොහෝ දෙමාපියන් සිතනුයේ ඔවුන්ගේ ප්‍රශ්න දරුවන්ට අදාළ නොවන බවයි. ඒවා දොරගුලු දාගෙන ගෙවල් තුළ සිරකර සගවා තබා ඇත. එහෙත් ඒම දොරගුලු ඇතුලේම සිටින දරුවන් කුමන මොහොතක කුමක් සිදුවේදැයි යන බිය කුතුහළය තුල බොහෝ රාත්‍රීන් නිදිවර්ජිතය. බියෙන් තැතිගෙන ඇත. බොහෝ විට මවගේ හෝ පියාගේ මතය වෙනුවෙන් ඔවුන් ප්‍රාන ඇපකරුවන් සේය. එබැවින් ඔබලාගේ ප්‍රශ්න ඔබලාගේ නිදන කාමරය තුළම දොරගුරු දමා සිරකර තබන්න. ඒසේ නොවී නම් ඔබගේ කෙතරම් පෞද්ගලික ප්‍රශ්නයක් වුවත් ළමයින් වින්දිතභාවයට පත්ව එය සමාජ ප්‍රශ්නයක් වනු ඇත.

කායික දණ්ඩනයට අමතරව ළමයින් මානසික දණ්ඩනයට ද ලක් වේ. සෑම කායික දණ්ඩනයක් තුළම මානසික හිංසනයක්ද ඇත. දණ්ඩනයේ බරපතලම ගැටළුව මානසික බලපෑමයි. මන්ද **වේවැල් හා කෝටු පහරින් ළමුන්ගේ සම හා ඇට බිඳ දැමිය හැකිය. ඒහෙත් වචන වලින් බිඳ දමනුයේ ළමයාගේ හදවතයි.** එබැවින් ඔබේ දරුවාට ඔබේ ශිෂ්‍යාට කුමන චේතනාවෙන් හෝ සිදු කරන

අවමන් කිරීම්, ප්‍රතික්ෂේප කිරීම්, හුදකලා කිරීම්, බියවැද්ද වීම්, නොසලකාහැරීම් නිසා ද ළමයාගේ උක්ත චර්යා අක්‍රමතා පෙන්නුම් කරනු ඇත.

දැනට ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහය පනතින් 308ඒ යටතේ භාරකාරිත්වයේ සිටින ළමයින්ට පහර දීම හිංසාකිරීම කෲරත්වය ලෙස හඳුන්වා වසර දහයක දඩුවමකටද යටත් කළ හැකිය. ඒසේම පාසල තුළ විනය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් 12/2016 දරන චක්‍රලේඛයෙන් ද ළමයින්ට පහර දීම වලක්වා ඇත.

එබැවින් දයාබර දෙමාපියනි......!

දයාබර ගුරුතුමනි.....!

- දරුවන්ට පහර නොදෙන්න
- ඔබ සංසුන්වීමෙන් පසු විනය ක්‍රියාමාර්ග ගන්න
- කෝපයට පත් වූ පසු විනය ක්‍රියාමාර්ග නොගන්න
- ඔබ කලබලයට පත් වූ පසු ළමයාගෙන් වෙන්ව සිටින්න
- තරහ පාලනය වූ පසු ධනාත්මක භාෂාවෙන් ගැටළුව ගැන සාකච්ඡාකර
- ප්‍රචණ්ඩත්වයෙන් තොර සාධනීය දඬුවම් පැමිනවීමෙන් ළමයා නිවැරදි කරන්න.

ප්‍රචණ්ඩත්වයෙන් සිදු වන හොද තාවකාලිකය.

එයින් සිදු වන නපුර සදාකාලිකය.

එම නිසා අපි ළමා හිංසනයට විරුද්ධ විය යුතුය.

චම්පික කේ. අයගම
අපරාධ මනෝවිද්‍යා විශ්ලේෂක